## **විෂයය**

බුද්ධ ධර්මය

## **නිපුණතාව**

බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය හැඳින ගෙන ඒ අනුව ක්‍රියා කරයි.

## **නිපුණතා මට්ටම**

බුදු දහම අනුව දැහැමි ධනෝපායන මාර්ග හා ධර්මික පරිභෝජන රටාව හැඳින ඒ අනුව කටයුතු කරයි.

## **පාඩම**

20

# සැපවත් දිවියකට මග

**සැකසුම - පූජ්‍ය තාරපේරියේ ගුණරතන හිමි**

**8 ශ්‍රේණිය**

**බුද්ධ ධර්මය**

**20 පාඩම**

**සැපවත් දිවියකට මඟ**

**i කොටස**

01. බුදුරජාණන් වහන්සේ දේශනා කළ අයුරින් නොකටයුතු වෙළඳාම් අතරින් බාල දෙය අගය කර විකිණීම.....
    1. මකුට නම් වේ. 2. මාන කූට නම් වෙයි .
    3. කංස කූට නම් වේ . 4. තුලදර නම් වෙයි.

02. ගිහියෙකු විසින් උපදවාගත යුතු සැප පිළිබඳ දේශනා කරන්නේ....
    1. සිඟාලෝවාද සූත්‍රයේ ය. 2. අණන සූත්‍රයේ ය.
    3. මහා මංගල සූත්‍රයේ ය. 4. මල්ලිකා සූත්‍රයේ ය.

03. තමා අල්ප වශයෙන් හෝ ණයක් නොමැති බව සිතා සතුටු වීම
    1. අත්ථි සුඛය ලෙස හැඳින්වේ.
    2. භෝග සුඛය ලෙස හැඳින්වේ.
    3. අණන සුඛය ලෙස හැඳින්වේ.
    4. අනවජ්ජ සුඛය ලෙස හැඳින්වේ .

04. විශාල ධනවතෙකු වූ චුල්ලන්තේවාසික පිළිබඳ සඳහන් වන්නේ.....
    1. උම්මග්ග ජාතකයේ ය. 2. චුල්ලසෙට්ඨි ජාතකයේ ය.
    2. ගුණ ජාතකයේ ය. 4. වෙස්සන්තර ජාතකයේ ය.

05. සිත, කය, වචනය, යනු ......
    1. තිදොර යි. 2. ත්‍රි ශික්ෂාවයි.
    3. ත්‍රිලක්ෂණයි 4. ත්‍රිවිද්‍යාවයි.

06. තමාගේ යහපත සඳහා පමණක් ධනය වැය කිරීම පිරිහීම හේතුවන කාරණයක් ලෙස....

1. සිඟාලෝවාද සූත්‍රයේ උගන්වයි.
2. පරාභව සූත්‍රයේ උගන්වයි.
3. මහා මංගල සූත්‍රයේ උගන්වයි.
4. අණන සූත්‍රය උගන්වයි..

07. උදුම්බරබාදික යනු ...

1. උපයන ධනය තමා වෙනුවෙන් පමණක් යොදවන්නා
2. උපයන ධනය පරිභෝග නොකරන්නා
3. උපයන ධනය සියල්ල විනාස කර නාස්තිකාර ලෙස පරිභෝගය සඳහා පමණක්ම යොදවන්නා
4. පංච බලය අනුව ධනය වියදම් කරන්නා

08. අජද්ධු මරණ යන්නෙන් අදහස් කරන්නේ...

1. උපයන ධනය තමා වෙනුවෙන් හෝ වියදම් නොකර මිය යන්නා
2. උපයන ධනය සියල්ල කා බී නාස්තිකර මිය යන්නා
3. උපයන ධනය ආත්මාර්ථය තකා පමණක් වියදම් කර මියයන්නා
4. උපයන දනය ධනය පරාර්ථය තකා පමණක් වියදම් කර මියයන්නා

09. බුදු දහමේ සඳහන් අදැහැමි වෙළඳාම් ක්‍රම ගණන...

1. 2 කි. 2. 3 කි. 3. 4 කි. 4. 5 කි.

10. මිච්ඡා ආජීව යනුවෙන් බුදුදහමේ සඳහන් වන්නේ.

1. නිවැරදි ජීවනොපායන්හි නිරතවීමය.
2. පස්පවින් තොරව ජීවත් වීමයි.
3. දස අකුසලෙන් යුතුව ජීවත් වීමයි.
4. වැරදි ජීවනෝපායෙන් ජීවත් වීමයි.

## ii කොටස

01. i. ගිහියන් විසින් උපදවාගත යුතු සැප පිළිබඳ දේශන කරන ලද සූත්‍රය කුමක් ද?
    ii. ඉහත සූත්‍රයේ සඳහන් සැප අතුරින් තුනක් ලියන්න.
    iii. නිවැරදිව ධනය ඉපැයීම තුළින් සමාජයට සැලසෙන වාසි මොනවා ද?

02. i. අත්ථි සුඛය යනු කුමක් ද?
    ii. ධනය ඉපයීමේ දී අවධානය යොමු කළ යුතු නිර්ණායක අතුරින් තුනක් ලියන්න.
    iii. අධාර්මික වෙළදාම් මොනවාද?

03. i. වෙළදාමේ දී ඇතැම් වෙළෙන්දන් භාවිත කරන උපක්‍රම අතුරින් තුනක් සඳහන් කරන්න.
    ii. ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න.
    iii. ණය නොමැතිව ජීවත් වීමෙන් පුද්ගල ජීවිතයට ලැබෙන වාසි පහක් ලියන්න.

## පිළිතුරු

### i කොටස

| | | | |
|---|---|---|---|
| 01. | 3 | 06. | 2 |
| 02. | 2 | 07. | 3 |
| 03. | 3 | 08. | 1 |
| 04. | 2 | 09. | 4 |
| 05. | 1 | 10. | 4 |

## ii. කොටස

01. i. අණාන සූත්‍රය

ii. •අත්ථි සුඛය

- භෝග සුඛය
- අණාන සුඛය
- අනවජ්ජ සුඛය

iii. 1. පුද්ගලයාගේ දේපල සුරක්ෂිත වේ.
2. සමාජය තුළ ගැටුම් ඇති නොවේ.
3. මත් වතුර විකිණීමෙන් වැළකීම තුළින් සෞඛ්‍ය සම්පන්න සමාජයකට උපකාරී වේ.
4. මනුෂ්‍ය  හා සත්ව ජීවිත ආරක්ෂාවේ.
5. පවුල් ආරාවුල් පවා නැතිවේ.

02. i. නිවැරැදිව ධනය ඉපැයූ ආකාරයත්  එම ධනය ගැන සිතා ඇති කරගන්නා සොම්නසත්  "අත්ථි සුඛය" නම් වේ.

ii. • උත්සාහවන්ත බව

- ඩහදිය වැගිරීම.
- ධාර්මික බව

iii. • අවි ආයුධ  වෙළදාම

- සත්ව වෙළදාම
- මස් වෙළදාම
- මත් ද්‍රව්‍ය වෙළදාම
- වස විස වෙළදාම

03. i. • තුලා කූට -

• මාන කූට

• කංස කූට

ii. තුලා කූට - වංචනික ලෙස තරාදියෙන් කිරීම

• මාන කූට - වංචනික ලෙස මැණීම

• කංස කූට - ව්‍යාජ වටිනාකම් පෙන්වා වංචනික ලෙස විකිණීම

iii. • මානසික සහනය හිමිවීම.

• අල්පේච්ඡ ජීවිතයකට මඟ පෑදීම.

• ණය පොලී ගෙවීමට අතිරේක ධනය ඉපයීමට සිදුනොවීම.

• හොඳ මූල්‍ය කළමනාකාරණයට හුරුවෙයි.

• පවුල තුළ සහයෝගය වර්ධනය වේ.